www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# "ඔහුගේ ජීවිතයේ ඒකායන අරමුන ජාත්‍යන්තරවාදී පක්ෂය ගොඩ නැගීම යි"

## විජේ ඩයස් කීර්ති බාලසූරියගේ අවමංගලෝත්සවයේ දී

## Speech made by Wije Dias at the funeral of Keerthi Balasuriya

**විජේ ඩයස්**
**1987 දෙසැම්බර් 23**

*ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) ආරම්භයේ පටන් ම එහි ප්‍රධාන ලේකම්ව සිටි කීර්ති බාලසූරිය සහෝදරයා 1987 දෙසැම්බර් 18 දා කොලඹ විකොස කාර්යාලයේ වැඩ කරමින් සිටිය දී වැලඳුනු හදිසි හෘදයාබාධයකින් අභාවයට පත් විය. 1987 දෙසැම්බර් 23 දා කොලඹ කනත්තේ දී පැවති ඔහුගේ අවමංගල්‍යෝත්සවයේ දී එවක දී විකොස මධ්‍යම කාරක සභික, වත්මන් සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් කල කතාව අපි පහත පල කරමු.*

මේ දුක්මුසු මොහොතේ දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සියලු ම ශාඛාවන් විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය සමග එක්ව එකා වන්ව එක් වීම ගැන අපි ආඩම්බර වෙමු.

කීර්ති බාලසූරිය සහෝදරයාගේ වියෝව විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට පමනක් නො ව හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට අසීමිත පාඩුවක් හා අහිමි වීමක් බව අමුතුවෙන් කිව යුතු නැහැ. ඔහු අන් සියල්ලට මත් වඩා ලෝක සමාජවාදී විප්ලවය සඳහා සටන් කල නායකයෙක්. කීර්ති සහෝදරයා සහ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය වෙන් කොට දැක්විය නොහැකි ලෙස අනන්‍ය යි. ඔහු විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාව ලෙස ගොඩ නැගීමේ ඒකායන අරමුන ඇතිව අරගලය කලා.

විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ඉතිහාසය එක් අතකින් කීර්ති බාලසූරිය සහෝදරයාගේ ඉතිහාසය ලෙස සටහන් වෙනවා. ඔහු දේශපාලන ජීවිතයට පිවිසුනේ පාසල් සිසුවෙකු ලෙස - 1965 අග භාගයේ උසස් පෙල සිසුවෙකු ලෙස - උගනිමින් සිටිය දී. ඔහු පාසලේ ඉතා මත් දීප්තිමත් සිසුවෙකු වූ බව වාර්තාගත යි. කම්කරු පන්තියේ දරුවන් තම උකුලට ගෙන විප්ලවවාදීන් ලෙස පෝෂනය කිරීමට හා පුහුනු කිරීමට තිබූ හැකියාව - 1964ට පෙර මේ රට තුල විශේෂයෙන් - කම්කරු පන්තියේ ජීවමාන ශක්තියක් ලෙස පැවතුනා. කීර්ති සහෝදරයා ඒ දීප්තිමත් තරුන ගනයට අයත් වූවෙක්. එහෙත් කීර්ති සහෝදරයා කම්කරු පන්තිය ඉටු කල මේ වෛෂයික කාර්ය භාරය මත රැඳී සිටීමට තීන්දු කලේ නෑ. ඔහු කම්කරු පන්ති ව්‍යාපාරය තුල නායකත්වයේ අර්බුදය විසඳීමට සටන් කල ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට - විප්ලවවාදී පක්ෂයට - ඉටු කිරීමට ඇති තීරනාත්මක කාර්ය භාරය තේරුම් ගත්තා; මේ අනුව යි ඔහු හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමග සම්බන්ධ වීමට තීන්දු කලේ.

විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය 1968 පැවැත්වූ ප්‍රථම සම්මේලනයේ දී අවුරුදු 19ක තරුනයෙකුව සිටි කීර්ති බාලසූරිය සහෝදරයා ප්‍රථම ප්‍රධාන ලේකම් තනතුර භාර ගැනීමට තීන්දු කිරීම එක් අතකින් ප්‍රකාශ කලේ, ලංකා සමසමාජ පක්ෂය 1964 සිදු කල මහා පාවා දීමේ දුෂ්ටත්වයේ තරම යි. ඔවුන් විසින් එක් පරම්පරාවක විප්ලවවාදී ව්‍යාපාරය විනාශ කර දමා තිබූ තත්ත්වයක දී අලුත් පරම්පරාවේ කීර්ති වැනි සහෝදරවරුන්ට විප්ලවවාදී පක්ෂය ගොඩ නැගීමේ කේන්ද්‍රීය වගකීම් දරා ගෙන පෙරට ඒමට සිදු වුනා.

1969-70 දී සමසමාජ-කොමියුනිස්ට් නායකයන්ගේ ද්‍රෝහී පාවා දීම්වල ප්‍රතිඵලයක් වශයෙන් පලල්ව තරුනයන් අතර පැතිර පැවති මංමුලාවන්ට එරෙහිව සටන් කිරීමට හැකි වූයේ කීර්ති බාලසූරිය සහෝදරයා ඇතුලු විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමග බන්ධනගත වී සිටි නිසයි. ද්‍රෝහී සභාග දේශපාලනය මගින් මංමුලාවට පත් කෙරුනු තරුනයන් ජනතා විමුක්ති පෙරමුන විසින් බිලී බා ගනිද්දී ඔවුන්ගේ සුලු ධනේශ්වර දේශපාලනය හෙලිදරව් කරමින් කීර්ති බාලසූරිය සහෝදරයා ලියූ *ජනතා විමුක්ති පෙරමුනේ දේශපාලනය හා පන්ති ස්වභාවය* නම් වූ ලිපි මාලාව - 1970 අග භාගයේ කම්කරු පුවත් පත්‍ර කලාපවල පල වූ ලියවිල්ල - කීර්තිමත් මාක්ස්වාදී ලේඛනයක් ලෙස ඉතිහාසගත වී තිබෙන්නක්.

සභාග ආන්ඩුවට වැදුනු සමසමාජ-කොමියුනිස්ට් ද්‍රෝහී නායකයන් ධනපතියන් සමග එක් වී කම්කරු පන්තියට එල්ල කල පහරවල දී පරදුවට ලක් වූ සෑම මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ම රැකීමට කීර්ති සහෝදරයා විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය මෙහෙයවා ගෙන පෙරමුන ගත්තා. කීර්ති සහෝදරයා තම දෑතින් පත්‍ර විකුනා ගෙන ගොඩ නැගූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ රජයේ මුද්‍රනාලයේ ශාඛාව 1972 වර්ගවාදී සිංහල බෞද්ධ ධනපති ව්‍යවස්ථාවට විරුද්ධව අභියෝග කිරීමට ස්වකීය වෘත්තීය සමිති ශාඛාව මෙහෙයවීම ඓතිහාසික අහම්බයක් නො වේ. සභාග ආන්ඩුවේ කප්පාදුවට ලක් වූ නිදහස් අධ්‍යාපනය රැකීමට, දඩයමට ලක් වූ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමට, රැකියාවලින් දොට්ට දැමීම්වලට විරුද්ධව කීර්ති සහෝදරයාගේ නායකත්වය යටතේ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය මූලිකත්වය ගත්තා.

අප මෙහි දී අමාරුවෙන් දේශපාලනය කතා කරනවා නො වේ. කීර්ති සහෝදරයාගේ ජීවිතය මේ රට හා ලෝක කම්කරු පන්තියේ ඉරනම සමග අත්‍යන්තයෙන් බැඳුනු එකක්. ඔහුගේ ජීවිතය ගැන කතා කල හැක්කේ පන්ති අරගලයේ ඉතිහාසය ගැන කතා කිරීමෙන් පමන යි. 1975 දී ලංකා සමසමාජ පක්ෂය සභාගයෙන් දොට්ට වැටී සභාගය පිපිරීමට පටන් ගත් විට නිශ්චිතව ම ඔප්පු වුනේ කීර්ති සහෝදරයාගේ නායකත්වය යටතේ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය පෙරදැක ඉදිරිපත් කල ඉදිරි දර්ශනයේ නිරවද්‍ය භාවය යි. සභාගය දේශපාලනිකව අයථා ය; කම්කරු පන්ති ස්වාධීනත්වය පාවා දී ඇති කල එකක් ය; විප්ලවවාදී නායකත්වය සම්පාදනය කල හොත් නිර්ධන පන්තිය ධනවාදය පෙරලා දැමීමේ සත්‍යතාව ජීවමාන කරන්නේ ය, යන්න සභාගය පිපිරීමෙන් පෙරමුනට ගෙන එනු ලැබූහ.

1977 යූඇන්පී ආන්ඩුව බලයට ඒමෙන් පසු විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ අරගලය, කම්කරු පන්තියේ ස්වාධීනත්වයත් ආන්ඩුව පලවා හැරීමට ඒ වටා පීඩිත ජනතාව බලමුලු ගැන්වීමටත් තියුනු ලෙස එල්ල වූ එකක්. මෙය වඩාත් තීරනාත්මක ලෙස පෙරට ගෙන එනු ලැබුනේ ප්‍රතිගාමී යූඇන්පී ආන්ඩුව වර්ගවාදී යුද්ධයෙන් දෙමල ජාතියේ ජාතික අයිතීන් මැඩීමට පෙරට ඒමත් සමග යි. සමසමාජ-කොමියුනිස්ට් හා මාධ්‍යමික පක්ෂ ධනේශ්වර යූඇන්පී-ශ්‍රීලනිප වර්ගවාදී ගොහොරුවට පනිද්දී, වර්ගවාදී යුද්ධයට එරෙහිව දෙමල ජාතියේ ජාතික ස්වයං නිර්නය අයිතිය සඳහා අරගලයේ මුදුනේ කම්කරු පන්තිය පිහිටුවීමට කීර්ති බාලසූරිය සහෝදරයා විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය සමග තම මුලු ශක්තිය යොදා සටන් කලා. ලංකාවේ කම්කරු පන්ති ව්‍යාපාරයට නායකත්වය දීම සඳහා ඔහු ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අරගලයෙහි මෙන් ම ඉන්දියානු බොල්ශේවික්-ලෙනින්වාදී පක්ෂයේ සියලු සාධනීය අතීත උරුමයන් පන ගැන්වීමට සටන් කලා.

කම්කරු පන්ති ව්‍යාපාරයේ ඉතිහාසය සමග බැඳී ගත් කීර්ති සහෝදරයාගේ ජීවිතය කීර්තිමත් විප්ලවවාදී ජීවිතයක්. අභියෝග කල නොහැකි එම එම ජීවන චරිතය ගැන ඔහුගේ සතුරන් අඩුපාඩුවක් ලෙස කියනු ඇත්තේ තමන්ගේ ශරීරයේ මයිලකින් වත් අවස්ථාවාදයට නම් මොන ම ඉඩක් වත් නොදීම යි. ඔහු පුදුම නිර්දය භාවයකින් අවස්ථාවාදය දුටු තැන පොල පොලා පහර දුන්නා. ධනපතියන්ට හා උන්ගේ ඒජන්තයන්ට තමන් කොයි මොහොතේ හෝ විකුනා ගැනීමට දඟලන්නවුන් ගැන ඔහු කොයි තරම් නම් වෛර කලා ද යන්න ඔහුගේ සමීපතමයන් ලෙස අපි හොඳින් දන්නවා. තම ජීවිතයට කා වැදී ගත් මේ ස්ථිරසාර මූලධර්මය මත ම පිහිටා ගෙන ඔහු ජාත්‍යන්තර කමිටුව තුල අවස්ථාවාදය දිගේලි කිරීමට තැත් කල භ්‍රෂ්ටයන්ට විරුද්ධව හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සහෝදරයන් - විශේෂයෙන් ම ඇමරිකාවේ වර්කර්ස් ලීගයේ සහෝදරයන් - සමග එක පෙරමුනේ පිහිටා සටන් කිරීමට එක් වූවා. භ්‍රෂ්ටයන්ගේ අවස්ථාවාදයට හා පාවා දීමේ දේශපාලනයට විරුද්ධව කම්කරු පන්ති ජාත්‍යන්තරවාදය යලි ජීවමාන කරවීමට ඔහු දිරිමත් සටනක් ගත්තා පමනක් නො ව, අවසාන මොහොත දක්වා ඔහු ජීවත් වූයේ ඉතා මත් බලවත් විප්ලවීය අපේක්ෂාවන් සහිතව යි.

විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ සාමාජිකයන්ගෙන්, තරුන සමාජවාදියෝ සාමාජිකයන්ගෙන් හා අනෙකුත් සහෝදරවරුන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, කීර්ති බාලසූරිය සහෝදරයාගේ කීර්තිමත්, ප්‍රෞඪ, ඖදාර්යයෙන් යුත් ජීවන චර්යාව තම ජීවන චර්යාව බවට පත් කර ගන්නා ලෙස යි. ඔහු ලෝක මානව වර්ගයාගේ විමුක්තිය සඳහා මේ යුගයේ අවශ්‍යව පවතින නිර්ධන පන්ති ආඥාදායකත්වය සඳහා - ලෝක විප්ලවය සඳහා තම මුලු ජීවිතය ම කැප කල සටන්කරුවෙක්. එය තම ජීවිත අරමුන ලෙස පිහිටුවා ගැනීම කිසි ම කෙනෙකුට පසුතැවිලි ගෙන නොදෙන අරමුනක්. ඒ සඳහා කැප වන ලෙස කීර්ති බාලසූරිය සහෝදරයාගේ මෘත ශරීරය ඉදිරියේ සිට අපි ඉල්ලමු.

© www.wsws.org